## සමාජ සවිබලගැන්වීම් හා සුභසාධන අමාත්‍යාංශය
**சமூக வலுவூட்டல் மற்றும் நலனோம்புகை அமைச்சு**
**MINISTRY OF SOCIAL EMPOWERMENT AND WELFARE**

| | | |
|---|---|---|
| මගේ අංකය :<br>**எனது இல.** MSS/NSPD/07/Man.Pay/Gen/2016<br>My No : | ඔබේ අංකය :<br>**உமது இல.** :<br>Your No. : | දිනය :<br>**திகதி**: 2016.07.28<br>Date |

චක්‍රලේඛ 1 /3/ 2015 NSPD ( i )

දිස්ත්‍රික් ලේකම්
දිස්ත්‍රික් ලේකම් කාර්යාලය

……………………………………

**<u>2015 අයවැය යෝජනා අනුව අඩු ආදායම් ලාභී ආබාධ සහිත පුද්ගලයන් සඳහා රු.3000/- ජීවනාධාර දීමනාව ගෙවීම</u>**

උක්ත කරුණ සම්බන්ධව 2015/04/27 දාතමින් යුතුව නිකුත් කරන ලද 1/3/2015/NSPD අංක දරණ චක්‍රලේඛය පහත සඳහන් පරිදි සංශෝධනය කරනු ලැබේ.

04. වගන්තිය : රැකබලා ගැනීමට කිසිවෙකුත් නොමැති ආබාධ සහිත පුද්ගලයන් රජයේ ආධාර **නොලබන** ආයතනයක ස්ථිරවම නිවාසගතකර ඇත්නම් මෙම ජීවනාධාරය ලැබීමට සුදුස්සන් වේ.

සංශෝධනය : රැකබලා ගැනීමට කිසිවෙකුත් නොමැති ආබාධ සහිත පුද්ගලයන් රජයේ ආධාර **ලබන/නොලබන** ආයතනයක ස්ථිරවම නිවාසගතකර ඇත්නම් මෙම ජීවනාධාරය ලැබීමට සුදුස්සන් වේ.

10. වගන්තිය : යම් ප්‍රතිලාභියෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් බැහැරව පදිංචිවුවහොත් මියගියහොත් හෝ අඛණ්ඩව මාස තුනක් මුදල් ලබා නොගතහොත් කඩිනමින් ගෙවීම් නැවැත්විය යුතුයි.

සංශෝධනය : යම් ප්‍රතිලාභියෙක් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයෙන් බැහැරව පදිංචිවුවහොත් මියගියහොත් හෝ අඛණ්ඩව මාස තුනක් මුදල් ලබා නොගතහොත් කඩිනමින් ගෙවීම් නැවැත්විය යුතුයි. **මෙහිදී කිසිලෙසකින්වත් හිඟ මුදල් ගෙවීමක් සිදු නොකල යුතුය.**


| | | |
|---|---|---|
| අමාත්‍යතුමා/ அமைச்சர்/ Minister | දුරකථන/தொ.பே./Tel. : 011–2861145 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011-2884613 |
| නියෝජ්‍ය අමාත්‍යතුමා/.பிரதி அமைச்சர்/Deputy Minister | දුරකථන / தொ.பே /Tel : 011-2877121 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011-2877126 |
| ලේකම්/செயலாளர்/Secretary | දුරකථන / தொ.பே /Tel. : 011-2883525 | ෆැක්ස් /பெக்ஸ்/Fax : 011-2187007 |
| අමාත්‍යාංශ කාර්යාලය /அலுவலகம்/Gen. Office | දුරකථන/ தொ.பே./Tel. : 011-2887349-51 | ෆැක්ස්//பெக்ஸ்/Fax : 011-2877127 |

අමාත්‍යාංශය / அமைச்சு / Ministry
1වන මහල, සෙත්සිරිපාය අදියර II,බත්තරමුල්ල
1ஆவது மாடி, செத்சிறிபாய கட்டம் II, பத்தரமுல்லை
1st Floor, Sethsiripaya Stage II, Battaramulla .

19. නව වගන්තිය : කිසියම් දිස්ත්‍රික්කයකට අයත් ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශයක අනුමත සීමාව තුල ප්‍රතිලාභියෙක් තමා පදිංචි කොට්ඨාශය අතහැර වෙනත් කොට්ඨාශයකට විධිමත්ව පදිංචිය හැරගොස් එම කොට්ඨාශයෙන් ජීවනාධාර ඉල්ලීමේදී ප්‍රතිලාභියා කලින් සිටි කොට්ඨාශයේ ප්‍රාදේශීය ලේකම්ගේ එකඟතාවය මත දිස්ත්‍රික් ලේකම්වරයාගේ මාර්ගයෙන් අදාල ප්‍රතිපාදන ප්‍රමාණය අඩුකර ඔහුගේ හෝ ඇයගේ පදිංචි කොට්ඨාශයට මාරුකර ගෙවීම් කිරීමට හැකියාව ඇත. නමුත් ඔහු හෝ ඇය පදිංචිය මාරු කරන්නේ වෙනත් දිස්ත්‍රික්කයකට නම් ඒ සම්බන්ධ ඉල්ලීම සමාජ සවිබලගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශයේ ආබාධ සහිතවූවන් සඳහා වන ජාතික මහ ලේකම් කාර්යාලයේ අධ්‍යක්ෂ වෙත යොමු කර අනුමැතිය ලබාගත යුතුය.

මේ සම්බන්ධයෙන් අමතර තොරතුරු අවශ්‍ය වේ නම් සමාජ සවිබලගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශයේ ආබාධ සහිත තැනැත්තන් සඳහා වූ ජාතික මහ ලේකම් කාර්යාලයෙන් ලබාගත හැකිය.

| | | |
|---|---|---|
| දුරකථන අංක - | අධ්‍යක්ෂ | - 0112863416 |
| | සහකාර අධ්‍යක්ෂ | - 0112877378 |
| | කාර්යාලය | - 0112877374 |

**මහින්ද සෙනෙවිරත්න**
**ලේකම්**

**පිටපත් :**

01. ලේකම් - මුදල් අමාත්‍යාංශය ( දැ.ගැ.ස )
02. ලේකම් - ස්වදේශ කටයුතු අමාත්‍යාංශය ( දැ.ගැ.ස )
03. ලේකම් - සෞඛ්‍ය හා දේශීය වෛද්‍ය අමාත්‍යාංශය ( දැ.ගැ.ස )
04. පළාත් ප්‍රධාන ලේකම්වරු ( දැ.ගැ.ස )
05. විගණකාධිපති ( දැ.ගැ.ස )
06. සියළුම දිස්ත්‍රික් ලේකම්වරු ( දැ.ගැ.ස )
07. සමාජ සේවා අධ්‍යක්ෂ ( දැ.ගැ.ස )
08. පළාත් සමාජ සේවා අධ්‍යක්ෂකවරු ( දැ.ගැ.ස )
09. සියළුම ප්‍රාදේශීය ලේකම්වරු ( දැ.ගැ.ස )
10. ප්‍රධාන ගණකාධිකාරී - සමාජ සවිබලගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශය ( දැ.ගැ.ස )
11. ප්‍රධාන අභ්‍යන්තර විගණක - සමාජ සවිබලගැන්වීම් හා සුභ සාධන අමාත්‍යාංශය ( අ.ක.ස )